C
891.485109
EDM

# දඹදෙණි යුගය තෙක් ලියැවුණු

# සිංහල ග්‍රන්ථ වංශයෙන් නිරූපිත සත්ත්ව ජීවිතය පිළිබඳ

# සාහිත්‍යමය විමර්ශනයක්

ශ්‍රී ලංකා

පේරාදෙණි විශ්ව විද්‍යාලයේ

දර්ශනශූරි උපාධිය

සඳහා

ඉදිරිපත් කළ නිබන්ධයයි.

1990

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

කේ. බී. ඒ. එඩ්මන්ඩ්

450074

## සාරාංශය

විද්‍යා අධ්‍යාපනය සඳහා වර්තමානයේ පළ කොට ඇති සත්ත්ව විද්‍යාව පිළිබඳ ඇතැම් පොත පතක සත්ත්ව පරිණාමය, හැසිරීම් රටාව යනාදිය පිළිබඳ සරල විස්තර ඇතුළත් වුව ද, ඒවා පැරණි ලේඛකයා විසින් නිරූපිත සත්ත්ව

ජීවිතය හඳුනා ගැනීමට අදාළ පූර්ණ අධ්‍යයන ප්‍රවේශයක් නොවන්නේය. පුරාවිද්‍යාත්මක ගවේෂණ මගින් හෙළි කැරෙන පැරණි සතුන් පිළිබඳ තොරතුරු ද බොහෝ විට සීමා වන්නේ , ඔවුන් විසූ අවධිය , විසූ පෙදෙස් හා එම සතුන්ගේ බාහිර හැඩ රුව, ප්‍රමාණය යනාදි කරුණු නිර්ණය කිරීම සම්බන්ධයෙන් පමණි. එම සතුන්ගේ හැසිරීම් රටාව, ජීවන ප්‍රවෘත්තිය , එසේම තත්කාලීන මිනිසා ඔවුන් ගැන සිතූ පැතූ දේ , ඔවුන් කෙරෙහි පැවති ආකාරය වැන්නක් ඉන් හෙළිවන්නේ අල්ප මාත්‍ර වශයෙනි. එසේ හෙයින් සිංහල ග්‍රන්ථ වංශයෙහි පවත්නා ඌනතාවක් මඳකින් හෝ පිරිමසාලීම පරමාර්ථ කොට ගෙන, "දඹදෙණි යුගය තෙක් ලියැවුණු සිංහල ග්‍රන්ථ වංශයෙන් නිරූපිත සත්ත්ව ජීවිතය පිළිබඳ සාහිත්‍යමය විමර්ශනයක්" නමැති මේ නිබන්ධය ඉදිරිපත් කරනු ලැබේ.

මෙහි ලා "සත්ත්ව ජීවිතය " යන්නෙන් අදහස් කැර ඇත්තේ තිර්යග්ගත සත්ත්ව ජීවිතයයි. බුදු දහමට අනුව "මානවයා " ද "සත්ත්ව " ගණයෙහි ලා ගැනුණ ද මෙහි දී ඔහු වෙන් කොට තිරිසන් සත්ත්ව ගණයා පමණක් මුල් කොට ඇත්තේයි. කරුණු සනාථ කිරීමෙහි ලා අදාළ තැනෙක්හි දී මිනිසා නො සඳහන් වන්නේ නොවේ.

අනුරපුර - පොළොන්නරු හා දඹදෙණි යන අවධිවල පමණක් ලියැවුණු සිංහල ග්‍රන්ථ ආශ්‍රිත ව මේ පර්යේෂණය සිදු කොට ඇත්තේ එම අවධිත්‍රය සිංහල ජනතාවගේ සිතුම් පැතුම් ආධ්‍යාත්මික සංවර්ධනයට බෙහෙවින් නැඹුරු වූ යුග සේ සලකන ලද බැවිනි.

පැරණි සිංහල සාහිත්‍යය බුදු දහමින් ප්‍රභාවිත වීමත් භාරතීය සාහිත්‍යාවලියෙන් පෝෂණය වීමත් නිසා එයින් නිරූපිත සත්ත්ව ජීවිතය වඩා විචිත්‍ර වූ ද විවිධ වූ ද ගැඹුරු වූ ද කථා විෂයක් බවට පත් වී ඇත්තේය.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY



හිංසාව පාපයක් කොට ඉගැන්වෙන, ක්‍ෂණ ජීවිතයේ පවා ආරක්ෂාව කෙරෙහි අවධානය යොදා ඇති බුදු දහමට අනුව සකස් කොට ගත්, මානසික පරිසරයකින් හෙබි ජනතාවක් සතු සාහිත්‍යයෙන් පිළිබිඹු කෙරෙන සත්ත්ව ජීවිතය කෙරෙහි අවධානය යෙදීම මානව ධර්ම විද්‍යාව හැදෑරීම සම්බන්ධයෙන් ද ඉතා වැදගත් වෙයි.

මේ නිබන්ධය ප්‍රධාන කාණ්ඩ තුනකින් සමන්විත වෙයි. සංඥා තරංගය නම් වූ ප්‍රථම කාණ්ඩයෙහි පරිච්ඡේද තුනකි. පළමු වැනි පරිච්ඡේදයෙන් පැරණි ජනයා තිරිසන් සත්ත්ව ලෝකය වර්ගීකරණයට හසු කළ අයුරු ද දෙවැනි පරිච්ඡේදයෙන් වර්ගීකෘත සත්ත්ව ගණ පිළිබඳ සරල හැඳින්වීම් ඇතුළු නාමාවලිය ද තෙවැනි පරිච්ඡේදයෙන් සත්ත්වයන් පිළිබඳ නාමකරණය, කුල බෙදීම යනාදි තොරතුරු ද දක්වා ඇත්තේය.

ද්විතීය කාණ්ඩය වූ භාව තරංගය පරිච්ඡේද චතුර්ථයකින් සමන්විත වෙයි. ඒ පරිච්ඡේද චතුර්ථයෙන් පිළිවෙලින්, විවිධ ප්‍රභේදගත තිරිසන් සත්ත්ව ගණයාගේ බාහිර අංගලක්ෂණ හා ගති පැවතුම් ද ආහාර පාන ද වාස-ස්ථාන ද චර්‍යාධර්ම ද විග්‍රහ කොට ඇත.

තෘතීය කාණ්ඩය වූ විචාර තරංගයට පරිච්ඡේද පඤ්චකයෙක් ඇතුළත් වේ. මේ පරිච්ඡේදවලින් තිරිසන් සතුන් පිළිබඳ ආගමික මත මතාන්තර හා සමාජ ආකල්ප, පැරණි සිංහල ලේඛකයා සත්ත්ව ජීවිතය කෙරෙහි හෙළූ දෘෂ්ටිය, මිනිසා හා තිරිසන් සතුන් අතර අතීතයේ සිට පැවති සම්බන්ධතා හා එහි විකාශය , ඇතැම් තිරිසන් සතුන් වටා ගෙතී ඇති ජන කථා - ජනප්‍රවාද හා ගැමි විශ්වාස ඇතුළු ජන ව්‍යවහාර හා සත්ත්ව ජීවිතයේ එතෙක් මෙතෙක් පවත්නා කාලීන වෙනස් කම් ද පරිසරය හා තිරිසන් සත්ත්ව ලෝකයේ අනාගතය ද පිළිවෙලින් විමර්ශනයට ලක් කොට ඇත්තේයි.

මෙය සාහිත්‍යමය විමර්ශනයකි. පැරණි සිංහල ගත්කරුවා සත්ත්ව ජීවිතය නිරූපණය කිරීමට ගත් ක්‍රියා මාර්ග හා ඉන් අපේක්ෂිත ඵල, ඔවුන් විසින් නිර්දිෂ්ට කරුණු ආශ්‍රයෙන් ගැඹුරට විමසා බැලීම මැ ප්‍රධාන පරමාර්ථය කොට ගත් බැවින් මෙය සාහිත්‍ය විමර්ශනයකට පමණක් සීමා කොට ඇත්තේය.

වර්තමානයේ දියුණුව ඇති ජීව විද්‍යාව හෝ එහි අංගයක් වන සත්ත්ව විද්‍යාව හෝ අනුව සත්ත්ව සම්භවය, පරිණාමය, ව්‍යවච්ඡේදය යනාදිය පිළිබඳ විග්‍රහ කිරීමක් මෙහි ලා අපේක්ෂා කොට නැත. එහෙත් පැරණි සිංහල ලේඛකයා විසින් නිරූපිත සත්ත්ව ජීවිතයේ ආරම්භය , හැසිරීම යනාදිය පිළිබඳ තොරතුරු වර්තමානයේ සත්ත්ව විද්‍යාවට අදාළ එබඳු තොරතුරු හා සමාන වන තැන් සංක්ෂිප්ත ව විමසීමට ලක් කැර ඇත.

සාහිත්‍ය ග්‍රන්ථ ආශ්‍රයෙන් කරනු ලබන මේ නිබන්ධයට ඇතුළත් කරුණු විමසිල්ලට ලක් කැර ඇත්තේ සාහිත්‍යමය දෘෂ්ටියකිනි. එයින් අපේක්ෂා කරන ලද්දේ සත්ත්ව ජීවිතය ඔස්සේ වක්‍ර ව හෝ ඍජුව හෝ දැක්වෙන මානුෂික හර පද්ධතිය හෙළිදරව් කිරීමයි. එබැවින් මෙය වාර්තා සැපයීමෙන් ඉදිරිපත් කෙරෙන ඓතිහාසික හෝ පුරා විද්‍යාත්මක හෝ විෂය බද්ධ කෘතියක් සේ නොව, සත්ත්ව ජීවිතය නිරූපණය කළ පැරණි ලේඛකයන්ගේ සමකාලීන චින්තනයෙහි හා විඥානයෙහි ප්‍රභාව ඔස්සේ ඉඟි කැරෙන, ජීවිත පරිඥාන කාරක ආධ්‍යාත්මික පණිවිඩය ගම්‍යමාන වන කෘතියක් සේ සංග්‍රහ කිරීමට යත්න දරා ඇත්තේය. කොටින් මැ ඉන් අදහස් කොට ඇත්තේ, පැරණි හෙළයන් තිරිසන් සතුන් නිසා ලද අත්දැකීම් හා දැනුම් සම්භාරය ඔස්සේ ජීවලෝකය හා පරිසරය සම්බන්ධයෙන් ඇති කැර ගත් චින්තාවලියත්, ඒ මගින් ඔවුන්ගේ ජීවිත හැඩ ගස්වා ගත් අයුරුත්, එසේ මැ ඒ ඥාන දායාදය පශ්චිම ජනයා වෙනුවෙන් ශේෂ කොට තුබූ අයුරුත් හෙළිදරව් කිරීමය.

මේ සඳහා උපයෝග කොට ගන්නා ලද්දේ අනුරපුර සමයේ සිට දඹදෙණි සමය තෙක් ලියැවී දැනට අවශිෂ්ට ව ඇති තිසකට නොවැඩි ග්‍රන්ථ සංඛ්‍යාවයි. එය ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් ගෙන ඇති අතර, විෂය කරුණු වඩාත් පැහැදිලි කිරීමට අවශ්‍ය වූ තැනෙක, තත්කාලීන මෙන් මැ පශ්චාත්කාලීන සෙල් ලිපි ද, ශාස්ත්‍රීය හා ඓතිහාසික ලිපි ලේඛන ද, කලා කෘති ද ප්‍රයෝජනයට ගෙන ඇත්තේය. ඊට අමතර ව ත්‍රිපිටක අටුවා ග්‍රන්ථ කීපයෙක් ද පරිශීලනය කෙරිණි. ඒ සියල්ල ද්විතීය මූලාශ්‍රය ලෙසින් සලකා ඇත්තේයි.

ශ්‍රේෂ්ඨ පුරුෂාර්ථ කරා සමාජය මෙහෙයවීම සාහිත්‍යයේ විශිෂ්ට පරමාර්ථයක් සේ සැලකෙන කලක යට කී අයුරේ පණිවිඩයක් කෙරෙහි අවධානය යෙදීම මහ මෙහෙවරක බැඳී යාමකි. ඒ මෙහෙවර සාර්ථක කර ගනු වස් ඉහත දැක්වූ ප්‍රධාන මූලාශ්‍රයන්හි ආ තිරිසන් සතුන් පිළිබඳ සියලුම තොරතුරු එක් රැස් කර, අදාළ කරුණු සාධනය කිරීම පිණිස අවශ්‍ය සාධක පමණක් පරිශ්‍රමයකින් වෙන් කැර ගැනිණ. ඒ සාධක කරුණු තරංගත්‍රය යටතේ වූ පරිච්ඡේද දොළොසේ විශ්ලේෂණාත්මක අයුරින් ඉතා පරිස්සමින් ඇතුළත් කරන ලද්දේය. නිබන්ධයෙහි ඇතුළත් කරුණු පිළිබඳ අර්ථ කථන දීමත් ඒ පිළිබඳ අගැයීමකට මහ පෙන්වීමත් මෙහි ලා යථා ශක්තියෙන් සිදු කොට ඇත්තේය.

මේ නිබන්ධය වූ කලී සොයා ගත් දත්ත පිළිබඳ පූර්ණ සංග්‍රහයෙක් නොවේ. විෂය ක්ෂේත්‍රය අනවශ්‍ය ලෙස දීර්ඝ වීම හා නිබන්ධන පරමාර්ථයේ සීමා ඉක්මවීම වළක්වනු පිණිස ඇතැම් තොරතුරු අකමැත්තෙන් වුව ද බැහැර ලීමට සිදු විය. උදාහරණයක් ලෙස සිංහල වෙදකමට තිරිසන් සතුන්ගෙන් ලැබුණු ප්‍රයෝජන සඳහන් කළ හැකිය. එවැන්නක් මෙහි ලා සාකච්ඡා කොට ඇත්තේ ඉතා සංක්ෂිප්ත අයුරිනි. එය පමණක් නොව මෙරට පැවති පැරණි සත්ත්ව වෛද්‍ය විද්‍යාව ද පෘථුල අයුරින් විමර්ශනයට භාජන විය යුත්තකි. එසේ මැ සතුන් සම්බන්ධයෙන් පැරණි

හෙළයන් දැරූ අදහස් සමකාලීන වශයෙන් හෝ ඊට පූර්වයෙහි හෝ භාරතයෙහිද පැරණි ශිෂ්ටාචාරවලට උරුමකම් කියූ වෙනත් රටවල ද එබඳු අදහස් හා ගැඹුරට සසඳා බැලීම පවා පෘථුල විෂය ක්ෂේත්‍රයකට අයත් වන්නකි. විස්තර බාහුල්‍ය භීතියෙන් එබඳු කරුණු ද මෙහි ලා සාකච්ඡා කොට ඇත්තේ ඉතා මැ සංක්ෂිප්ත අයුරිනි. බෙහෙවින් මැ අවශ්‍යයැ යි හැඟුණු තැනෙක පමණක් ඒ පිළිබඳ ව ප්‍රමාණවත් අයුරින් කරුණු ඉදිරිපත් කොට ඇත.

වර්තමානයේ බහුලව දත්නට ලැබෙන "සමනලයා " පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථාවලියෙන් ඉවතට පියා හඹා ඇත්තේ කවර හෙයින් ද? එසේ නැත-හොත් මේ ප්‍රාණියා තවමත් එහි සැඟවී සිටින්නේ ද? එසේ නම් ඒ කවර තැනෙක්-හි ද? වැනි තැන් ඉතා සියුම් ලෙසප පරීක්ෂණයට භාජන කළ යුතුව ඇත.

කෙසේ වුව ද විද්‍යාර්ථීනට මේ විමර්ශනය මත නැඟී සිංහල සාහිත්‍යයේ යටැ කී අයුරේ මං පෙත් ඊසත් ඔස්සේ තවත් පෘථුල සාහිත්‍යමය පර්යේෂණ සඳහා නැඹුරු වීමට යෝග්‍ය හා අවශ්‍ය පසුබිම මෙයින් සකස් කොට ඇති බව ද මෙහි ලා අවධානයට හසු කළ යුත්තකි.

ප්‍රධාන මූලාශ්‍රයට අයත් සාහිත්‍ය කෘතියකින් උපුටා ගත් වාක්‍යයක් හෝ වාක්‍යාංශයක් හෝ මෙහි එන හැම පරිච්ඡේදයක ම මාතෘකා පාඨය වශයෙන් යොදා ඇත. ඒ අනුව පළමුවන දෙවන සිවුවන සයවන අටවන හා දොළොස්වන පරිච්ඡේද සඳහා කර්ම විභාගයෙන් ද තෙවන පරිච්ඡේදය සඳහා අමාවතුරෙන් ද පස්වන නවවන හා දසවන පරිච්ඡේද සඳහා ධර්මප්‍රදීපිකාවෙන් ද සත්වන පරි-ච්ඡේදය සඳහා දහම් සරණින් ද එකළොස්වන පරිච්ඡේදය සඳහා බුත්සරණින් ද මාතෘකා පාඨ උපුටා ගෙන ඇති බව ද සැලකිය යුත්තකි.[8]

නූතන ජීව විද්‍යාව දියුණුවන තුරු බොහෝ රටවල පැරණි ජනයා තිරිසන් සතුන් දෙස බැලුවේ ආගමික මත මතාන්තර මගින් දීප්ත වූ භූත දයාව ද මිශ්‍ර වූ හැඟීම්වලිනි. ශිෂ්ටාචාරය තරා එළඹෙමින් සිටි පැරණි මිනිසා අදෘෂ්ට ක්ෂුද්‍රප්‍රාණියාගේ පටන් මානවයා දක්වා ගැනුණු සියලුම සත්ත්ව ගණයා දෙස භාවනා- මය මනසකින් හා ආධ්‍යාත්මික ප්‍රබෝධයකින් බලන්නට පුරුදු විය. බෞද්ධ දර්ශනයෙන් ප්‍රභාවිත පැරණි සිංහල ලේඛකයා එහි ගැඹුරට මැ පිවිසෙයි. මේ නයින් විශ්ව සම්භාව්‍ය මහා කාව්‍යයකට නොදෙවැනි අයුරින් චමත්කාරජනක වූ ද විචිත්‍ර වූ ද රසවත් වූ ද සත්ත්ව ලෝකයේ අපූරු කථාව පැරණි සිංහල සාහිත්‍යයෙහි ද බොහෝ දුරට ගැබ් වී ඇති බව දන්නෝ හඳුනන්නෝ අල්පයහ. මේ නිබන්ධය ඒ අපූරු ලොවට පිවිසීමට පෙරටු කළ පහනක් පමණි.

කේ. බී. ඒ. එඩ්මන්ඩ්.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY